**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව -2012**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක - 1 අනුව, වත්කමක් වාර්තා කරන දිනයේ සිට මාස 12 ක් ඇතුලත උපලබ්ධි කරගැනීමට අපේක්ෂා කරණ විට එම වත්කම ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කල හැක. එසේ වුවත්, සෙස් අරමුදල උපයෝගි කරගෙන භාණ්ඩාගාර බිල්පත් වල සිදු කර තිබුණු ආයෝජන වත්කම් ශේෂපත්‍ර දිනයේ සිට මාස දොලහක කාලයක් තුල උපලබ්ධි කර ගැනීමට අපේක්ෂා නොකල සමුච්චිත ආයෝජන රු. මිලියන 1,827 ක් ජංගම වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක -7 අනුව, කල්බදු වත්කම් සඳහා වන ක්ෂය ප්‍රතිපත්තිය, හිමිකම ඇති වත්කම් සඳහා වන ක්ෂය ප්‍රතිපත්තියට අනුරූප විය යුතුය. එසේ වුවත්, හිමිකම ඇති සහ කල්බදු ක්‍රමය යටතේ ලබාගත් මෝටර් රථ සඳහා වෙනස් වූ ක්ෂය ප්‍රතිපත්තීන් කොමිසම විසින් අනුගමනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෝටර් රථ සඳහා වන වර්ෂයේ ක්ෂය වියදම රු. 540,500 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර තිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ඉකුත් වර්ෂයේ බැහැර කර තිබුණු කල්බදු ක්‍රමය යටතේ මිලට ගත් මෝටර් රථ වල වටිනාකම ගිණුම් වල ගලපා නොතිබුණි. එම නිසා වටිනාකම රු. 3,800,000 ක් වූ මෝටර් රථ සහ එහි වටිනාකම ප්‍රමාණය හා සමුච්චිත ක්ෂය ගිණුම්වල වැඩියෙන් පෙන්නුම් කෙරුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු. 628,884 ක් වූ ඉන්වෙන්ට්‍රි අයිතමයන්, සත්‍යාක්ෂණ වාර්තා නොවීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත | | |
| (1) 8(1) වගන්තිය | | අයවැය ලේඛණයක් පිළියෙල කර තිබුණද,එය මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනක කාලයක් ඉකුත් වීමට පෙර පිළියෙල කර නොතිබුණි. |
| 14(1) වගන්තිය | | කොමිෂන් සභාවේ කාර්යසාධනය දක්වමින්, කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. අතර එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් නොකෙරුණි. |
| (ආ) අංක පීඊඞී/12 සහ 2003 ජුනි 03 දිනැති යහපාලනය සඳහා මගපෙන්වීමේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | | |
| (i) 4 පරිච්ඡේදයේ 4.2.2 වගන්තිය | | තථ්‍ය කාර්යසාධනය තහවුරු කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් සංයුක්ත සැලැස්ම, සහ අයවැය කාර්යසාධනය කලින් කලට සමාලෝචනය කල යුතුය, එසේ වුවත්, කොමිෂන් සභාව විසින් කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමයක් ඇතිකර නොතිබුණි. |
| (ii) | 7 පරිච්ඡේදයේ 7.2 වගන්තිය | කොමිෂන් සභාව විසින් එහි ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි පරිචයන්/ අත්පොත් තබාගත යුතුය. එසේ වුවත්, පරිචයන්/ අත්පොත් සකස් කර නොතිබුණි. |
| (iii) | 9 පරිච්ඡේදයේ 9.12 වගන්තිය | රාජ්‍ය ව්‍යාපාරයක් අනුගමනය කරනු ලබන ඕනෑම සුභසාධන යෝජනා ක්‍රමයක් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත් කොමිෂන් සභාව විසින්, සේවක වෛද්‍ය රක්ෂණ සුභසාධන යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි. 2013 සැප්තැම්බර් 13 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් මා වෙත පහත සඳහන් පරිදි දන්වා තිබුණි. "විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභා පනතේ 43(2) වගන්තිය අනුව කොමිෂන් සභාවේ නිලධාරීන්ට හා සේවකයන්ට සුදුසු පරිදි ගෙවීම් කිරිමට හා දීමනා ලබා දීමට හැකිය. රජයේ නීති හා රෙගුලාසි වලින් බැහැරව හා අවහිරයකින් තොරව විනිමය සහ සුරැකුම්පත් කොමිෂන් සභාවට සේවකයන් බඳවා |

| | | |
|---|---|---|
| | | ගැනීමටත් ඔවුන්ගේ වැටුප් හා දීමනා නිශ්චය කිරීමටත් හිටපු භාණ්ඩාගාර ලේකම්වරයා විසින් ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවට අනුමැතිය ලබා දී තිබුණි.” |
| (iv) | 9 පරිච්ඡේදයේ 9.14 වගන්තිය | මානව සම්පත් කළමනාකරණයට අදාල සියළුම කරුණු ඇතුලත් රීති සහ රෙගුලාසි පිළිබඳ පරිච්ඡේදයක්ද ඇතුලත්වන පරිදි ක්‍රියාපරිපාටි සංග්‍රහයක් පිළියෙල කර ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගෙන පාලක මණ්ඩලය විසින් අනුමත කලයුතුය. එසේ වුවත් කොමිෂන් සභාව මෙකී නියමයන්ට අනුව කටයුතුකර නොතිබුණි. |

(ඇ) ඉහත සඳහන් අනුකූල නොවීම් වලට අමතරව, රාජ්‍ය ආයතන සඳහා අදාල වන රජයේ චක්‍රලේඛ නියමයන් හා උපදෙස් සහ අනෙකුත් රීති හා රෙගුලාසි කොමිෂන් සභාව විසින් අනුගමනය කර නොතිබුණි. එසේ වුවත්, කොමිෂන් සභාව විසින් රජයේ රීති හා රෙගුලාසි වලින් බැහැර වීම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙයට අමතරව, 1989 අංක 36 දරන ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභා පනතේ මෙවැනි බැහැර වීමේ ප්‍රතිපාදන ඇතුලත් කර නොතිබුණි.

### 1.2.5 අධිකාරිබලයකින් තොර ගනුදෙනු

ප්‍රසාද දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගන්නා ලෙස රාජ්‍ය ව්‍යාපාර කමිටුව නියෝග කර තිබුණද, මෙකී අනුමැතිය ලබාගැනීමකින් තොරව ප්‍රසාද දීමනා ගෙවීම් දිගින් දිගටම සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණු ප්‍රසාද දීමනා ප්‍රමාණය රු. 9,893,659 ක් විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මෙහෙයුම් සඳහා සෙස් අරමුදලින් මාරු කිරීම් සැලකිල්ලට ගැනීමට පෙර ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය වූ රු.184,993,953 සමඟ සසඳන විට 2012 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මෙහෙයුම්වල ප්‍රතිඵල රු.206,497,805 ක ශුද්ධ ඌනතාවයක් විය. එම වර්ෂය සඳහා සෙස් ශුද්ධ අතිරික්තය වූ රු. 7,401,390 සමඟ සමාලෝචිත වර්ෂයේ සෙස් අරමුදලින් මාරු කිරීම් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව වූ රු. 12,024,832 ශුද්ධ අතිරික්තය සමග සැසදීමේදී ශුද්ධ අතිරික්තයේ රු. 4,623,442 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාවේ ආදායම සෙස් අරමුදලින් කරන ලද රු. මිලියන 218 ඇතුලත්ව රු. මිලියන 255 ක් විය. ඉකුත් වර්ෂයේ අනුරූපී ආදායම සෙස් අරමුදලින් කරන ලද රු. මිලියන

192 ඇතුළත්ව රු. මිලියන 235 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ආදායමෙහි සියයට 8.5 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. එසේම ඉකුත් වර්ෂයේ කොටස් වෙළඳපල සංවර්ධන වියදම වූ රු. මිලියන 228 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ඊට අනුරූපී වියදම රු. මිලියන 244 ක් විය. මෙය සියයට 7 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ආදායම් හා වියදම් වල වෙනස්වීම පහත දැක්වේ.

| | 2012 | 2011 | වෙනස්වීම | |
|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | % |
| සෙස් අරමුදලින් මාරු කිරීම් | 219 | 192 | 27 | 14 |
| තැරැව්කාර බලපත්‍ර ගාස්තු, පරිපාලන බදු සහ අධ්‍යාපන වැඩසටහන් | 21 | 29 | (08) | 27 |
| විවිධ ආදායම් | 16 | 14 | 02 | 14 |
| සේවක මණ්ඩල හා පරිපාලන පිරිවැය | 219 | 187 | 32 | 17 |
| ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන වියදම් | 24 | 41 | (17) | 41 |
| වර්ෂයේ අතිරික්තය | 12 | 07 | 05 | 71 |

ඉකුත් වර්ෂයේ සේවක මණ්ඩල වියදම වූ රු. මිලියන 114 ක ප්‍රමාණය 2012 වර්ෂයේදී රු. මිලියන 140 දක්වා සියයට 23 කින් වැඩිවී තිබුණි. එසේ වුවත්, ප්‍රාග්ධන වෙළඳ පොල සංවර්ධන වියදම, ඉකුත් වර්ෂයේ වියදම වූ රු. මිලියන 41 සිට සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 24 දක්වා සියයට 41කින් අඩුවී තිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

කැපී පෙනෙන කාරක ප්‍රාග්ධන අනුපාතයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| අනුපාතය | සම්මත අනුපාතය | 2012 | 2011 |
|---|---|---|---|
| ජංගම අනුපාතය | නිශ්චය කර නොතිබුණි. | 23:1 | 23:1 |

| | | | |
|---|---|---|---|
| ක්ෂණික අනුපාතය | - එම- | 23:1 | 23:1 |

❖ සෙස් අරමුදල හැර

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 කොටස් වෙළඳපල කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂය හතර සඳහා වූ රට තුල පැවති කොටස් වෙළඳපලට අදාල ඇතැම් තොරතුරු පහත දැක්වේ.

| | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| සමස්ථ පිරිවැටුම (රු.බිලියන) | 214 | 546 | 570 | 142 | 110 |
| දේශීය (රු. බිලියන) | 161 | 487 | 465 | 99 | 51 |
| විදේශීය (රු. බිලියන) | 53 | 59 | 105 | 43 | 59 |
| කොටස් පරිමාව (කොටස් ප්‍රමාණය මිලියන) | 9,691 | 24,544 | 18,489 | 4,763 | 3,155 |
| දෛනික සාමාන්‍ය පිරිවැටුම (රු. මිලියන) | 884 | 2,285 | 2,396 | 593 | 464 |

රටේ පැවති සිවිල් යුධ තත්ත්වය 2009 වර්ෂයේදී නිමාවීමත් සමගම, ඉකුත් වර්ෂ සමහ සැසඳීමේදී කොටස් වෙළඳ පල පිරිවැටුම කැපීපෙනෙන ලෙස වෙළඳ පල පිරිවැටුම රු. බිලියන 570 ක් ලෙස වාර්තා කරමින් සියයට 301කින් වර්ධනය විය. එසේ වුවත්, මෙම වර්ධනය සමාලෝචිත වර්ෂයේදී සීඝ්‍ර ලෙස සියයට 60 කින් අඩුවූ අතර 2011 වර්ෂයේ කොටස් වෙළඳපල පිරිවැටුම රු. බිලියන 546 සිට 2012 වර්ෂයේදී රු. බිලියන 214 දක්වා අඩු වී තිබුණි. එසේම, කොටස් වෙළඳපොලේ ගනුදෙනු කරන ලද කොටස් පරිමාවද 2011 වර්ෂයේදී ගනුදෙනු වූ කොටස් මිලියන 24,544 සිට 2012 වර්ෂයේදී කොටස් මිලියන 9,691 දක්වා සියයට 61 කින් අඩුවී තිබුණි.

3.1.2 ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන කටයුතු

------------------------------------------

සංයුක්ත සැලැස්මේ සහ ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු ඉලක්ක ලඟාකර ගැනීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් තිබුණු බව විගණනයේදී හඳුනාගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන සහ පර්යේෂණ

(i) රජයට අයත් ව්‍යාපාර සහ විශාල සංස්ථාවල කොටස් හෝ ණය බැඳුම්කර නිකුත් කිරීම දිරිමත් කිරීමටත්, කොළඹ කොටස් හුවමාරුව සහ සමාගම් රෙජිස්ටාර්වරයා හා එක්ව සංස්ථා බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රියා පරිපාටිය සරල හා පහසු කිරීමටත් කොමිෂන් සභාව සැලසුම් කර තිබුණි. එසේ වුවත් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ii) විශ්‍රාම පාරිතෝෂික අරමුදල් දිරිගැන්වීම සඳහා කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රාග්ධන වෙළඳපල අනාවරණය කිරීම් වැඩි කිරීමට 2011 වර්ෂයේදී විශ්‍රාම පාරිතෝෂික අරමුදල් භාරකරුවන් සඳහා ප්‍රාග්ධන වෙළපලක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත් 2013 අගෝස්තු දක්වා එය පවත්වා නොතිබුණි.

(iii) ණය වෙළඳාම් පද්ධති දිරි ගැන්වීම තුළින් බැඳුම්කර වෙළඳපල සංවර්ධය කිරිමට කොළඹ කොටස් හුවමාරුව සමඟ සම්බන්ධීකරණය වීමට සැලසුම් කළද 2013 අගෝස්තු අවසානය දක්වා කොළඹ කොටස් හුවමාරුව වෙත ණය වෙළඳාම් පද්ධතිය වෙනස් කිරිමේ නියෝජනය පමණක් සිදු කර තිබුණි.

(iv) ප්‍රාග්ධන වෙළඳපල යටිතල පහසුකම් වැඩි දියුණු කිරිමේ පහසුකම් සැලසීමට, 2011 පලමු කාර්තුව තුල කොළඹ කොටස් වෙළඳපල නිර්- සංගතකරණය කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ඉලක්ක කර තිබුණද එම කටයුතු 2013 අගෝස්තු අවසානය දක්වාද අවසන් කර නොතිබුණි.

(v) ආයෝජන බැංකු ශක්තිමත් කිරීමට නියාමක අවශ්‍යාංග ශක්තිමත් කිරීමට, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ඉලක්ක කර තිබුණද එම කටයුතු අවසන් කිරීමට සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කරන තෙක් ප්‍රමාද වී තිබුණි. තවද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයෝජන කළමනාකරුවකුගේ සේවය ලබාගැනීමට රු. මිලියන 500 ක වත්කම් පදනම් කරගත් පෞද්ගලික විශ්‍රාම වැටුප් අරමුදලක් ඇති කිරීම සඳහා නියෝග කිරීමට කම්කරු දෙපාර්තමේන්තුව විසින් යෝජනා කලද එය වඩා සුදුසු කාලයකදී ඇති කිරීමට විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව විසින් කල් දමා තිබුණි.

(vi) 2010 වර්ෂය අවසාන වන විට කොළඹ කොටස් වෙළඳපල සමඟ නිෂ්කාශන සංස්ථාවක් පිහිටුවා අවසන් කිරීමට ඉලක්ක කලද එය වර්ෂ දෙක හමාරක ප්‍රමාදයකින් පසුවද 2013 අගෝස්තු දක්වා අවසන් කර නොතිබුණි.

(ආ) සංයුක්ත කටයුතු :

ලැයිස්තුගත සමාගම්වල විගණකවරුන් කළ වැඩ පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් කිරිමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය සමඟ සහයෝගයෙන් යෝජනා ක්‍රමයක් විධිමත්ව පැනවීමේ කාර්යය, කාර්යමණ්ඩල හිගය නිසා තවදුරටත් ප්‍රමාද වී තිබුණි. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් 2013 සැප්තැම්බර් 13 දින පහත සඳහන් පරිදි මා වෙත දන්වා තිබුණි. "ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත

මෙහෙයුම් මණ්ඩලය ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව සමඟ යෝජනා ක්‍රමය සම්බන්ධව ගිවිසුමක් ඇතිකර ගැනීමට එකගතාවයක් නොවූයෙන් නීතිමය අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව විසින් විගණන මණ්ඩලයක් පිහිටුවීමේ හැකියාව පිළිබඳ හෝ ලැයිස්තුගත සමාගම් වල විගණකවරුන් සඳහා මඟපෙන්වීම් සංග්‍රහයක් කෙටුම්පත් කිරීමට කටයුතු කරමින් පවතී. "

(ඈ) විමර්ශන :

සංයුක්ත සැලැස්ම ප්‍රකාරව, තොරතුරු තාක්ෂණ යෙදවුම් භාවිතා කර විමර්ශන සඳහා දත්ත මූලායන් වැඩි දියුණු කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් 2013 සැප්තැම්බර් 13 දින පහත සඳහන් පරිදි මා වෙත වාර්තා කර තිබුණි. "අරමුදල් වෙන් කිරීමේ අවශ්‍යතාවය මූල්‍ය හා පරිපාලන අංශය වෙත දැනුවත් කල අතර තොරතුරු තාක්ෂණ කළමනාකරු සමඟ අවශ්‍ය සාකච්ඡා පවත්වන ලදී. අදාල කාලය 2014 පලමු කාර්තුව දක්වා දීර්ග කරන ලදී. "

(ඇ) අධීක්ෂණ :

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිති මෙහෙයුම් මණ්ඩලයේ සහයෝගයෙන් බලපත්‍රලාභී/ ලියාපදිංචි ආයතනවල බාහිර විගණකවරුන් සමඟ වාර්තා කිරිමේ රාමුවක් වැඩි දියුණු කිරීම සහ ඒකක භාරවල කළමනාකරණ සමාගම් සඳහා ඉලෙක්ට්‍රෝනික් ලිපිගොනුගත කිරීම ක්‍රියාත්මක කිරීමේ කටයුතු වසර 3 කට වඩා ප්‍රමාද වී තිබුණි.

(ඉ) ආවේක්ෂණ :

2010 වර්ෂය මුලදී අධ්‍යකෂවරුන්ගේ සහ බාහිර පුද්ගලයන් සඳහා දත්ත මූලායක් සංස්ථාගත කිරීමට සහ විධිමත්ව සැකසීමේ කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වුවද තොරතුරු රැස්කිරීමේ අපහසුතා නිසා එය 2013 අගෝස්තු දක්වා අවසන් කර නොතිබුණි. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් 2013 සැප්තැම්බර් 19 දින මා වෙත පහත සඳහන් පරිදි වාර්තා කර තිබුණි. "ලැයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ පෞද්ගලික තොරතුරු, සම්බන්ධිත පාර්ශවයන් ලෙස සලකා ලබා ගැනීම පිණිස, එම තොරතුරු විධිමත් ලෙස ඉල්ලා සිටීමේ හැකියාවක් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට නොමැත. එපමණක් නොව, අවශ්‍ය තොරතුරු ලබාදෙන ලෙස අධ්‍යක්ෂවරුන්ගෙන් ඉල්ලා සිටීමේ නීතිමය පදනමක් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට නැත. කොළඹ කොටස් හුවමාරුවේ නව සමාගම් ලියාපදිංචි වීම ආකර්ෂණය කර සංවර්ධනය කරමින් පවතින අවස්ථාවක මෙවැනි තොරතුරු ඉල්ලා සිටීම එම සංවර්ධන කටයුතු සඳහා තවත් බාධාවක් විය හැකිය. අධ්‍යක්ෂවරුන් ලෙස ලැයිස්තුගත සමාගමක සේවය කිරීම බාධා කිරීමක්ද මෙයින් සිදුවනු ඇත. කොළඹ කොටස් හුවමාරුවේ වර්ථමාන පසුබෑස්ම යථාතත්ත්වයට පත්කිරීමේ කාර්යයට මෙය සෘණ සාධකයක්ද විය හැකිය. මෙම නිසා මෙම කාර්ය අත්හැර දමන අතර නුදුරු අනාගතයේදී මෙම කාර්ය නැවත නොකරනු ඇත."

(ඊ) නීති හා බලාත්මක :

(i) නව සමාගම් අත්පත් කර ගැනීම හා ඒකාබද්ධවීම පිළිබඳ නීති සංග්‍රහය අවසන් කිරීමේ කටයුතු කොටස් වෙළඳපල නිර්- සංගතකරණය සඳහා බලය පැවරීමට නීතිමය රාමුවක් පිහිටුවීම සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමේ කටයුතු

තවදුරටත් කෙටුම්පත් මට්ටමේ සහ අවසන් කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයක් වාර්තා වී තිබුණි.

(ii) වෙළඳපල අතරමැදියන්, ණය ප්‍රමාණනය කිරීමේ නියෝජිතායතන, ආයෝජන කළමනාකරුවන්, සාධ්‍යකයන් සහ අරමුදල් සපයන්නන් සඳහා ඉලෙක්ට්‍රානික දත්ත ගොනුගත කිරීමේ ක්‍රමයක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ගුණාත්මක හා විශ්වාසවන්තභාවය

පරිගණක දෘඩකාංග හා මෘදුකාංග අත්පත් කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ රු. මිලියන 72.4 ක මුදලක් වැය කර තිබුණද, කොමිෂන් සභාවේ තොරතුරු අවශ්‍යතාවයන් හා පාලන අවශ්‍යතාවයන් හඳුනා ගැනීමෙන් පසුව, විධිමත් පද්ධතීන් හා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ පනත අනුව, මිල ගණන් වංචා කිරීම, අභ්‍යන්තර සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු, තැරැව්කරුවන්ගේ සදාචාර විරෝධි ක්‍රියාවන් යනාදි හඳුනාගත් නීති උල්ලංඝනය කිරීමේ අවස්ථා අවම කර ගැනීම සඳහා ප්‍රමාදයකින් තොරව ක්‍රියා කල යුතුය. එසේ වුවත්, පසුගිය වර්ෂ තුනක කාලය තුල කොමිෂන් සභාව විසින් හඳුනාගත් සිද්ධීන් 147 ක් අතුරින් සිද්ධීන් 54 ක් සමාලෝචිත වර්ෂය තුල ආවේක්ෂණ අංශය සහ කොළඹ කොටස් වෙළඳපල හරහා හඳුනාගෙන තිබුණු අතර සිද්ධීන් 40 ක් පමණක් ආවේක්ෂණ / විමර්ශන කමිටුව මගින් තවදුරටත් විමර්ෂනය සඳහා අනුමත කර තිබුණි. කොමිෂන් සභාවෙන් ලද ප්‍රතිචාරය පරිදි 2013 අගෝස්තු අවසාන වන විට විමර්ශන 25 ක කටයුතු අතරින් විමර්ශන 11 ක කටයුතු පමණක් අවසන් කර ලිපිගොනු වසාදමා තිබුණි. විශේෂයෙන් විමර්ශන කටයුතුවල සැලකිය යුතු ප්‍රමාදයක් තිබුණු බව නිරික්ෂණය විය.

3.4 හඳුනාගත් පාඩු

නිළධාරීන් දෙදෙනෙකුට වෙන්කර තිබුණු වාහන දෙකක් විකුණා ලබාගෙන තිබුණු ලාභය වූ රු. 3,772,362 ක මුදලක් කොමිෂන් සභාවේ ආදායමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට අදාල නිලධාරීන්ට පවරා දී තිබුණි. එසේම මෙකී ලාභය අදාල නිලධාරීන්ට පෞද්ගලිකව පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් කළමනාකරණය

ප්‍රසම්පාදනයන් සිදුකරන අවස්ථාවලදී අවශ්‍යතා හඳුනා ගැනීම, සමාලෝචනය, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි අධියරයන් හඳුනා ගැනීම සහ ඇස්තමේන්තු සැකසීම යන කටයුතු කොමිෂන් සභාව විසින් ප්‍රසම්පාදන මගපෙන්වීම් වල නියමයන්ට අනුව සිදුකර නොතිබුණි.

3.6 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

(අ) යෝජනා කරන ලද කොමිෂන් සභාවේ සංවර්ධන කටයුතු සැලකිල්ලට ගනිමින් මානව සම්පත් සැලැස්මක් හා මානව සම්පත් කළමනාකරණ පරිපාටි සංග්‍රහයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සංයුක්ත සැලැස්මේ යෝජනා කර තිබුණු පරිදි මානව සම්පත් කළමනාකරන තොරතුරු පද්ධතියක් හඳුන්වා දීමට අවශ්‍ය සඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) කාර්ය සාධනය ඇගයීම පද්ධතියේ අංගයක් ලෙස වාර්ෂික වන්දි ගෙවීම් පිළිබඳ සමාලෝචනයක් වාර්ෂිකව සිදුකර නොතිබුණි.

(ඈ) විගණනයට ලබාගත හැකිවූ තොරතුරු වලට අනුව, කොමිෂන් සභාවේ සේවා කාංඩ 07 කට අයත් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මුළු සේවක සංඛ්‍යාව පිළිවෙලින් සේවකයන් 82 ක් හා 72 ක් විය. සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී කොමිෂන් සභාව විසින් වැටුප්, වේතන සහ අනෙකුත් දීමනා සඳහා පිළිවෙලින් රු. මිලියන 140 ක් සහ රු. මිලියන 114 ක් වැය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේ එක් සේවකයෙකු සඳහා වූ පිරිවැය පිළිවෙලින් රු. 1,711,110 ක් සහ රු. 1,583,647 ක් විය.

3.7 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කල තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂයේ වාහන 06 ක ඉන්ධන, නඩත්තු හා අළුත්වැඩියා වියදම් සඳහා රු. 1,747,453 ක් වැය කර තිබුණි. ධාවනය කර තිබුණු දුර ප්‍රමාණය කි.මීටර් 66,384 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කි. මීටරයකට ධාවන පිරිවැය රු. 26.32 ක් ලෙස පෙන්නුම් කෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීම් ලෙස කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ වරුන්ට රු. 8,621,638 ක මුදලක් වැයකර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

2010 සිට 2012 වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. ඉහත සැලැස්ම සංශෝධනය කර 2012 සිට 2014 වර්ෂය දක්වා ආවරණය වන පරිදි නව සැලැස්මක් පිළියෙල කර තිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂය තුල නිම කිරීමට සැලසුම් කර තිබුණු ඇතැම් ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරි සැලැස්ම

සමාලෝචිත වර්ෂය තුල ලගාකර ගැනීමට සැලසුම් කල ඉලක්කයන් නිශ්චිතව නොදක්වා ක්‍රියාකාරි සැලැස්ම සංයුක්ත සැලැස්ම සමඟ ඒකාබද්ධ කර තිබුණි.

4.3 අභ්‍යන්තර විගණන කටයුතු

කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු පෞද්ගලික විගණන සමාගමකට පවරා තිබුණි. එසේ වුවත්, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5) (ඩී) වගන්තිය ප්‍රකාරව, අභ්‍යන්තර විගණන සැලැස්ම විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් තුනක් පවත්වා තිබුණු අතර කළමනාකරණ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට නිර්දේශ කර තිබුණි. එසේ වුවත්, 2013 මැයි අවසානය දක්වා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණි.

4.5 ප්‍රසම්පාදන සැලැස්ම

කොමිෂන් සභාවට අවශ්‍ය ප්‍රසම්පාදනයන් පිළිබඳ ඇගයීමක් කර ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.6 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 11.1 ක් වැය කර තිබුණි. එසේ වුවත්, ප්‍රාග්ධන වියදම් සඳහා විස්තරාත්මක අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කල මාගේ විස්තරාත්මක වාර්තාව මගින් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානය යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) අයවැය.
(ආ) මාසික බැංකු සැසඳුම් වාර්තා පිළියෙල කිරීම.
(ඇ) මානව සම්පත් කළමනාකරණය.
(ඇ) ප්‍රසම්පාදන.

(ඉ) ගිණුම්කරණය.
(ඊ) තොරතුරු තාක්ෂණ කළමනාකරණය .